මාර්ටින් වික්‍රමසිංහ ශූරීන් විසින් රචිත විරාගය නව කථාව හා එම නව කථාව පාදක කොට, ඒ නමින් නිර්මාණය වූ සිනමා සිතුවමද, කලාත්මක අංගයන් විසින් බලන කල, සමකාලීන ලාංකේය ඉතිහාසයේ, නූතන කලා ක්ෂේත්‍රයේ උච්චතම තැනක් හොබවන, සුවිශේෂ, ශ්‍රේෂ්ඨ කලා නිර්මාණ බවට සැකයක් විවාදයක් නොමැත. නවකථාව හා චිත්‍රපටය යන දෙකම මෑත කාලයේ දී බෞද්ධ ගැමි සංස්කෘතිය ඇසුරෙන් බිහි වූ එහි උච්චස්ථානයක් පිළිබිඹු කරන ශ්‍රේෂ්ඨ අවස්ථාවන් ලෙස අමරණීය වී හමාරය.

සිංහල බසින් එදා මෙදා ලියවී ඇති ශ්‍රේෂ්ඨතම යථාර්තවාදී නවකථාව ලෙස බොහෝ නිවහල් විචාරකයින් විසින් අවිවාදයෙන්ම වාගේ පිළිගනු ලබන විරාගය (1956) වූ කලී ජීවිතය දෙස උපේක්ෂාවෙන් බැලූ හා මමත්වය තුනී කර ගත්, අරවින්ද ජයසේන නම් වූ අපූර්ව පුද්ගලයා වටා ගෙතුණු චමත්කාරජනක වූත්, ශෝකාකූලවූත් වර්ණනාවකි. වික්‍රමසිංහගේ පමණක් නොව සමස්ථ සිංහල සාහිත්‍ය වංශයෙහිම අපට හමුවන ඉතාමත් ප්‍රබල හා සියුම් ලෙස පාඨක හද සසල කරන කථාව විරාගය යයි පෙන්වා දීම අභියෝගයක් නොවේ යයි සිතමි.

නවකථාව පළවී වසර ගණනාවක් යනතුරු එය පාඨකයාගේ අමන්දානන්දයටත්, පහන් සංවේගයටත්, නොමසුරු ඇගයීමටත් හේතුවිය. උඩුගං බලා ගිය අරවින්දගේ චරිතයත්, වෙසෙසින් ම අරවින්ද හා නවකථාවේ ප්‍රධාන ස්ත්‍රී චරිත යුග්මය වන බතී හා සරෝජිනී අතර සබඳතාවන් හි යථා ස්වභාවයත් හරිහැටි අවබෝධ නොකර ගත්, ඇතැම් අංකූර නොවන ගුණදාස

**ජයන්ත ආනන්දප්පා**


අමරසේකර වැනි විචාරකයින් පවා විරාගය නවකථාවේ  ඇති දුර්වලකම් සොයමින් නවකථාව අවතක්සේරු කිරීමට යත් දැරූ ප්‍රවණතාවක්ද හැටගණන්වල  පෙනෙන්නට තිබිණි. බොහෝ අවියත් විචාරකයින් අරවින්ද දුටුවේ පරාජිත චරිතයක් ලෙසය.

මෙබඳු අවිචාරවත්, හරසුන් විචාරයන්ට ප්‍රතිචාරයක් හැටියට වික්‍රමසිංහ සිය "නවකථාංග හා විරාගය" පළ කළේ 1965 වසරේදී ය. එයට ඉහත වික්‍රමසිංහ ලියා පළ කළ -සිංහල විචාර මඟ" සමඟ උගත යුතු එහි දෙවන කාංඩය වැනි "නවකථාංග හා විරාගය", විරාගය නවකථාව හා එය අරබයා ලියැවුණු විචාරයන් පිළිබඳව උනන්දුවක් දක්වන කවරෙකු විසින් ද කිවයුතු අගනා විචාරාත්මක ග්‍රන්ථයකි.

විවාදයට තුඩු දුන් සිය නවකථාවේ යම් යම් අංග ශා සිදුවීම් පිළිබඳව අර්ථ කථනයක යෙදුණු වික්‍රමසිංහ, විචාරයේදී විචාරකයා කථා වස්තුව :ඡකදඑ* හෝ වස්තු හරය පමණක් විමසීමේ පටු වළලුවලින් ඔබ්බට ගොස් නවකථාවක සන්දර්භය හා සාකල්‍යාර්ථයද පිළිබඳ ගැඹුරු අධ්‍යනයක් ලැබිය යුතු යයි පෙන්වා දුන්නේය. එසේම සිය නව කථාවේ හමුවන ඇතැම් අවස්ථා සංවාද හා වර්ණනා තේරුම් කර දීමට වික්‍රමසිංහ උපයෝගී කරගත්තේ, සුප්‍රසිද්ධ ඉංග්‍රීසි නවකථාකරුවෙකු හා විචාරකයෙකු වන ඊ එම් ෆාස්ටර් (E.M. Faster) විසිවෙනි සියවසේ මුල්භාගයේදී පමණ, සිය "නව කථාංග" (Accept of the Novel) විචාර ග්‍රන්ථය තුලින් ප්‍රථම වරට ලොවට හඳුන්වා දුන්, ඩස්ටවිස්කි, හර්මන් මෙල්විල් හා එමලි බ්‍රොන්ටේ වැනි සම්භාවනීය බටහිර නවකථා කරුවන් කිහිපදෙනෙකුගේ ඇතැම් නවකථාවල දක්නට ලැබෙන "prophecy" යන නවකථාංගයයි. වික්‍රමසිංහ " prophecy" වචනය වෙනුවෙන් යොදා ගන්නේ " භවිෂ්‍යක් විදර්ශනාව" යන්නය.

විරාගය නවකථාව පිළිබඳව දිගින් දිගට කථා කිරීම මෙම ලිපියෙහි අරමුණ නොවේ. නව කථාව පිළිබඳව කෙටියෙන් හෝ හැඳින්වීමක් නොකොට, එම නව කථාව ඇසුරෙන් බිහි වූ චිත්‍රපටයෙහි ශ්‍රේෂ්ඨත්වය හෝ එවැනි සියුම් නවකථාවක් සිනමාවට නැගීමේ කර්තව්‍යයේ භාරදූත්වයද හෝ පිළිබඳව අදහසක් නූතන පාඨකයාට ලබාදිය නොහැකිය. මළ ඇඳ සිට ආත්ම ශුද්ධිය පතා අතීතය ආවර්ජනය කරන්නට තතනන පුද්ගලයෙකුගේ පාපොච්චාරණය වැනි අරවින්ද ජයසේනගේ ජිවිත කථාව කිසිම අයුරකින් සිනමාව නිගැය නොහැකි සිතුවිලි මාලාවක් පමණෙකියි සිනමා ක්ෂේත්‍රයේ පවා සිටි බොහෝ අය සිතා සිටියහ.

සිංහල සිනමාවේ හා කලා ක්ෂේත්‍රයේ දැවැන්තයෙකු වන තිස්ස අබේසේකර තිර රචනය කර අධ්‍යක්ෂණය කළ විරාගය චිත්‍රපටය, එහෙත් මෙතෙක් නිපදවූ




විශිෂ්ඨතම චිත්‍රපට දෙක තුනෙන් එකක් බව මධ්‍යස්ථ විචාරකයින් පිලිගෙන හමාරය. මුල් අඩසිය වස තුල තිරගත වූ චිත්‍රපට අතරෙන් හොඳම චිත්‍රපට දහයෙන් හොඳම තුන හැටියට නිල වශයෙන් තෝරාගනු ලැබුවේ නිධානය (1972) ගම්පෙරළිය (1964) හා විරාගය (1987) යි. මෙම චිත්‍රපට ත්‍රිත්වයටම විවිධ මට්ටමෙන් අබේසේකරගේ දායකත්වය ලැබීම විශේෂත්වයක් ලෙස මම සලකමි. ගම්පෙරළියට අමතර දෙබස් සපයා සහය අධ්‍යක්ෂණය කළේ තිස්සය. නිධානයට දෙබස් හා තිර රචනය ඉදිරිපත් කළේද තිස්සය.

විරාගය චිත්‍රපටය නිසැක වශයෙන්ම අබේසේ-'කරගේ සිනමා ජීවිතයෙහි අග්‍රඵලයයි. විරාගය අභිබවා යා හැකි චිත්‍රපටයක් ඔහු අතින් නැවතත් බිහිවිය නොහැකිය යන අදහස අප තුළ ඇති විය. හැකි තරමටම, චිත්‍රපටය විශිෂ්ටය. එසේම තිස්ස අතින් නිර්මාණය වූ චිත්‍රපට දෙකම ඔහුගේ දෙවැනි පෙළේ චිත්‍රපට ලෙස හැඟෙන තරමටම විරාගය උසස්ය, ප්‍රබලය, සිනමාරූපීය. මෙම ප්‍රකාශනයෙන් කරුමක්කාරයෝ හා මහ ගෙදර යන අගනා සිනමා කෘතීන් පහත් කොට නොතකන බව සැලකුව මනාය. සමස්ථයක් වශයෙන් බලන කල, විරාගය චිත්‍රපටය සිනමා කරුවෙකු ලෙස අබේසේකරගේ නෛසර්ගික ප්‍රතිභානයත්, සිනමා මාධ්‍ය පිළිබඳ හසල අවබෝධයත්, නවකථාව අරබයා ඔවුනට සතු සියුම් වූත් නිවැරදි වූත්, වැටහීමක් මොනවට හුවා දක්වන්නකි. චිත්‍රපටය කලාත්මක නිර්මාණයක් ලෙස සාර්ථක වීමට එක් හේතුවක් වූයේ මේ සාධකයි. චිත්‍රපටයේ පලුදු, දුර්වලතා නොතිබුණා නොවේ. කලාත්මක අංශයෙන් විරාගය හා සමකල හැකි චිත්‍රපටයක් අබේසේකර අතින් ඉන්පසු නිර්මාණය නොවීම සිංහල සිනමාවට සිදුවූ බලවත් පාඩුවකි.

මහජන ප්‍රදර්ශනය සඳහා විරාගය මුලින්ම තිරගත වූ විට (1987 ඔක්තොම්බර් මස) සමාජයේ සෑම තරාතිරමකම ප්‍රේක්ෂකයින් චිත්‍රපටය එදා ආදරයෙන් වැළඳගත් ආකාරය අපට තවමත් මතකය. විරාගය වැනි විරල මාදිලියේ චිත්‍රපටයක් ලද ප්‍රබලතම ජයග්‍රහණය ප්‍රේක්ෂක ප්‍රතිචාරයයි. එය කලාත්මක සිංහල සිනමාවද ලද විශාල ජයග්‍රහණයකි. විරාගය වැනි චිත්‍රපටයක් එකල ප්‍රේක්ෂකයින් ප්‍රතික්ෂේප කළේ නම් එය කලාත්මත සිංහල සිනමාවේ පැවැත්මට වදින පහරක් වනු නො-අනුමානය.

චිත්‍රපටයේ ආත්මය බඳු අරවින්දගේ චරිතයට පණ දෙමින් අනපේක්ෂිතව සනත් ගුණතිලක කළ සියුම් වූත්, සිත් ගන්නා සුළු වූත් විශිෂ්ඨ වූත් රංගනය තුළින් වින්දනයක් නොවින්දෝ ද

